# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1832/32 – 2013 ඔක්තෝබර් 17 වැනි බ්‍රහස්පතින්දා – 2013.10.17

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/22/07/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්
ඩී. විමලසේන මයා, ජී. 148, අරන්දර, අටාල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්


1A – G 18402 – 200 (2013/10)


*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මහනුවර, වටපුළුව, ජය මාවත, අංක 53 හි කේ. ආර්. එම්. එන්. ලෝරන්ස් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/22/07/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්
ඩී. විමලසේන මයා, ජී. 148, අරන්දර, අටාල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ.-**

01. ඩී. විමලසේන මහතාට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් 2002.01.01 දින ලබාදුන් උසස්වීමට අනුව හිඟ වැටුප් නොගෙවීම යුක්තිසහගතද? එසේ නොවන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද?

02. ඩී. විමලසේන මහතා වෙත 2002.09.18 දින හා 2012.10.21 දින අවස්ථා දෙකකදී ප්‍රදානය කළ වැටුප් වර්ධක මුලින් ලබාදී පසුව 2004/4 දරන චක්‍රලේඛනය මගින් අහෝසිකර ආපසු අයකර ගැනීම යුක්තිසහගතද? එසේ නොවන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද?

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ,
කාර්යාලයේ දී දින යොදන ලදී.

11-127

---

මගේ අංකය: IR/15/25/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්
01. ජේ. මීගහවත්ත මයා, නො. 148/8ඒ, සමුපකාර වත්ත පාර, මාකන්දන, මඩපාත,
02. ටී. ටී. එස්. චන්ද්‍රකුමාර මයා, නො. 70ඒ, අරුණවත්ත, සාදික්කාවත්ත, වට්ටප්පොළ, පිළිමතලාව,
03. ඩබ්. දයානන්ද මයා, "ශ්‍රියානන්ද", නො. 308/6, මොරකැටිය, ඇඹිලිපිටිය.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්
සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොලොන්නාව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

වත්තල, හැඳල, නිමල මරියා මාවත, නො. 33/2 හි,පාලිත වීරසේකර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/15/25/2012.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

එක් පාර්ශ්වයක් වශයෙන්

01. ජේ. මීගහවත්ත මයා, නො. 148/8ඒ, සමුපකාර වත්ත පාර, මාකන්දන, මඩපාත,
02. ටී. ටී. එස්. චන්ද්‍රකුමාර මයා, නො. 70ඒ, අරුණවත්ත, සාදික්කාවත්ත, වට්ටප්පොළ, පිළිමතලාව,
03. ඩබ්. දයානන්ද මයා, "ශ්‍රියානන්ද", නො. 308/6, මොරකැටිය, ඇඹිලිපිටිය.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොලොන්නාව.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය** වනුයේ,

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි ආරක්ෂක අංශයේ සේවය කරන ජේ. මීගහවත්ත මහතා, ටී. ටී. එස්. චන්ද්‍රකුමාර මහතා සහ ඩබ්. දයානන්ද මහතා යන සේවකයින්ට බී - 1 ශ්‍රේණියේ ආරක්ෂක නිලධාරී තනතුර නොලැබීමෙන් යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න සහ එලෙස අසාධාරණයක් සිදුවූයේ නම් ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

11 - 128

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.